(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 141.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 අප්‍රේල් 07 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

749/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් මේ වනවිට ඉන්ධන සහනාධාරය ලබන ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) ඉන්ධන සහනාධාරය නිසි වේලාවට ධීවරයන්ට ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

842/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ ඇති පළාත් පාලන ආයතන රාශියක් විසින් අපද්‍රව්‍ය බැහැර කරනු ලබන කරදියාන ප්‍රදේශයේ අපද්‍රව්‍ය බලශක්ති බලාගාරයක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ බව දන්නේද;

(ii) එමඟින් ජනනය කිරීමට අපේක්ෂා කරන ලද විදුලි ඒකක ප්‍රමාණය කොපමණද;

(iii) එම බලාගාරය ඉදිකිරීම සඳහා මේ වනවිට වැය කර තිබෙන මුදල කොපමණද;

(iv) එම බලාගාරය ඉදිකිරීමේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

884/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරළේපත්තුව, වාලච්චේනෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ ඉහත කාලය තුළ එම පුද්ගලයන්ට 'උරුමය' සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් සමහර පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1014/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා දිවයින පුරා සහ උතුරු පළාත තුළ කාන්තාවන්ට එරෙහි අපරාධ සම්බන්ධයෙන් වාර්තා වූ මුළු සයිබර් අපරාධ පැමිණිලි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රජයේ නිල සයිබර් අපරාධ වාර්තා කිරීමේ ද්වාර (Portals) හෝ පොලිස් සයිබර් ඒකක හරහා ලැබුණු එවැනි පැමිණිලි සංඛ්‍යාව උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ග්‍රාමීය ප්‍රදේශවල, විශේෂයෙන්ම උතුරු පළාතේ කාන්තාවන් උදෙසා අපරාධ වාර්තා කිරීමේ යාන්ත්‍රණවලට සහ වින්දිත සහාය සේවාවලට ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1030/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විවිධ සැත්කම් සඳහා කොළඹ, රිජ්වේ ආර්යා ළමා රෝහලේ පොරොත්තු ලේඛනවල මේ වනවිට සිටින ළමයින් සංඛ්‍යාව කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා එම රෝහලේ සිදු කරන ලද සැත්කම් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වයස අවුරුදු 16 දක්වාවූ ළමයින්ට පමණක් ප්‍රතිකාර ලබා ගත හැකි මෙම රෝහලේ විවිධ සැත්කම් සඳහා පොරොත්තු ලේඛනවල සිටිය යුතු කාලය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1089/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනය සඳහා අලුතින් ලබාගත් A330-200 wide body ගුවන්යානය ලබා ගත් සමාගමේ නම කවරේද;

(ii) එම සමාගම නිර්දේශ කරන ලද්දේ කවුරුන් විසින්ද;

(iii) ඉහත ගුවන්යානයේ නිෂ්පාදිත දිනය කවරේද;

(iv) එම ගුවන්යානය ලබා ගෙන ඇත්තේ කුලී පදනම මතද;

(v) නොඑසේ නම්, බදු වාරික ගෙවීමේ පදනම මතද;

(vi) එසේ නම්, මාසික බදු වාරිකය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1246/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තඹුත්තේගම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පොහොර තොගයක් ගබඩා කර තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම පොහොර ප්‍රමාණය කොපමණද;

(iii) එම පොහොර ගබඩා කර ඇත්තේ කවර වර්ෂයක සිටද;

(iv) ඉහත පොහොර තොගය මේ වනතෙක් ගොවීන්ට බෙදා නොදීමට හේතු කවරේද;

(v) එම පොහොර තොගය ගොවීන් වෙත බෙදා දීමට සැලසුම් කර තිබේද;

(vi) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(vii) ඉහත පොහොර තොගය ගොවීන්ට බෙදා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1369/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වලින් සහ පෞද්ගලික පාසල්වලින් වාර්තාවූ අපයෝජන සහ හිංසන ක්‍රියා සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අපයෝජන සහ හිංසන ක්‍රියා හේතුවෙන් පාසල් හැර යාම් සහ සිය දිවි නසා ගැනීම් වාර්තාවී තිබේ නම්, එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පාසල් හැර යාම් සහ සිය දිවි නසා ගැනීම් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ අපයෝජන සහ හිංසන ක්‍රියා සිදු වීම වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1679/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'අස්වැසුම' වැඩසටහන සම්බන්ධයෙන් ලැබීදී ඇති අභියාචනා සහ විරෝධතා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා අතරින් නිරාකරණය වෙමින් පවතින සහ නැවත ප්‍රතිලාභ ලබා දුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම නිරාකරණ ක්‍රියාවලිය අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 'අස්වැසුම' ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා විද්‍යාත්මක දත්ත පද්ධතියක් හඳුන්වාදීමට අපේක්ෂා කරන්නේද;

(ii) එමඟින් තහවුරු කර ගැනීමට අපේක්ෂා කරනු ලබන නව දත්ත කවරේද;

(iii) ව්‍යාජ තොරතුරු මත ප්‍රතිලාභ ලබාගත් පුද්ගලයින් හඳුනාගෙන තිබේද;

(iv) ඔවුන්ට ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට සහ ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, ආපසු අයකර ගත් මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ජීවන වියදම අනුව 'අස්වැසුම' ප්‍රතිලාභ ගැලපීමට යෝජනාවී තිබේද;

(ii) ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන් ආරම්භ කිරීමට පියවර ගෙන තිබේද;

(iii) ඒ සඳහා දේශීය හෝ විදේශීය අරමුදල් වෙන් කර තිබේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යැමේ දී මෙම පාර්ලිමේන්තුව 2026 අප්‍රේල් 09 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,— 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව 2026 සම්බන්ධයෙන් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියෝගය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 4ඊ වගන්තිය සමඟ කියවිය යුතු 3 වගන්තිය යටතේ සුදුසුකම් නිර්ණායක සහ බදු නිදහස් කිරීම් හෝ බදු දිරි ගැන්වීම් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 පෙබරවාරි 08 දිනැති අංක 2474/66 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.19 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ රීති,— 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7 (1)(ඇ) වගන්තිය සහ VI වන කොටස සමඟ කියවිය යුතු 105 වගන්තිය යටතේ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒම සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් සාදන ලදුව, 2026 ජනවාරි 30 දිනැති අංක 2473/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2026 පෙබරවාරි 20 දින පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් මතු දැක්වෙන තත් කාරක සභා නිර්දේශ පිළිගත යුතු ය:—

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) හි පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීම:—**

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතල මූල්‍ය වංචා, අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සිදුව

ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී සිද්ධීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් ඍජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) හි පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීම:—**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරික්ෂා කිරීමේ දී බරපතල මූල්‍ය වංචා, අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී සිද්ධීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් ඍජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

*6.

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා,— ලංකා ධීවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2018),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය යටතේ 2025.02.14 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ධීවර සංස්ථාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.09.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.09.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*7.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— යුද්ධ හමුදා පනත යටතේ නියෝග,— (357 අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ 29 සහ 155 වගන්ති යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— නාවික හමුදා පනත යටතේ නියෝග,— (358 අධිකාරය වූ) නාවික හමුදා පනතේ 161 වගන්තිය යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ගුවන් හමුදා පනත යටතේ නියෝග,— (359 අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ 29 සහ 155 වගන්ති යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

බේරාගැනීම, පුනරුත්ථාපනය සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*16.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

17.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

18.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (අවලංගු කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

1849/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ණය සහනදායක ආඥාපනත සහ එහි කාර්ය පටිපාටිය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුවේ 2025.07.15 දිනැති වාර්තාව ලැබී තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද;

(iii) එම කමිටු වාර්තාවේ සඳහන් ප්‍රධාන නිර්දේශ කවරේද;

(iv) එම නිර්දේශ අනුව මේ වනවිට සිදු කර ඇති පරිපාලන වෙනස්කම් කවරේද;

(v) කමිටු වාර්තාවේ නිර්දේශ අනුව සිදු කිරීමට අපේක්ෂිත නීතිමය සංශෝධන කවරේද;

(vi) එම සංශෝධන සම්බන්ධයෙන් දැනට පවතින ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ණය සහනදායක මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ණය සහනදායක මණ්ඩලයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව කොපමණද;

(iv) 2026 වර්ෂය සඳහා ණය සහනදායක මණ්ඩලය වෙනුවෙන් රජය විසින් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1865/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ හිමිකම් සහතික ලබා දීම ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) මේ දක්වා එම පනත යටතේ ලබාදී ඇති හිමිකම් සහතික ප්‍රමාණය කොපමණද;

(iii) ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ මේ වනවිට සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ නීතිමය තත්ත්වය යාවත්කාලීන කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, යෝජිත නීතිමය ප්‍රතිසංස්කරණ කවරේද;

(iii) එම නීතිමය ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1866/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) 'Clean Sri Lanka' ජනාධිපති කාර්යසාධක බලකායේ වර්තමාන සාමාජිකයන් කවුරුන්ද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ මෙතෙක් ක්‍රියාත්මක කොට අවසන් කරන ලද ව්‍යාපෘති කවරේද;

(iii) එලෙස අවසන් කර ඇති ව්‍යාපෘති සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම ව්‍යාපෘති සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2024.12.19 දිනැති අංක 2415/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ විස්තර කර ඇති I සිට IX දක්වාවූ එක් එක් කාර්යයේ මේ වනවිට ප්‍රගතිය සහ ඒ සඳහා වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1930/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 අංක 43 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත මඟින්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9(අ) වගන්තිය සංශෝධනය කර පැමිණිලිකරුගේ පදිංචිය මත පදනම්ව දිසා අධිකරණයේ නඩු පැවරීම සඳහා හැකියාව ලබාදීම නුසුදුසු බවත්;

(ii) ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් එම 9(අ) වගන්තිය සංශෝධනය කර නීතිය පෙර පැවති තත්ත්වයට පත් කළ යුතු බවට ඉල්ලීමක් කර ඇති බවත්;

(iii) එම සංශෝධනය කඩිනමින් සිදු කරන බවට පාර්ලිමේන්තුව අමතමින් අවස්ථා කිහිපයකදී ප්‍රකාශ කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?